# සුබස් සිතිවිලි



වි ක ධර්මබන්ධු

"හරි ලාක්ෂණය් හරි ලාක්ෂණය්
හරි ලාක්ෂණය් ඔය මැණිකෙගෙ සුදු සේලේ"

දශක හත අටකට පෙර පලමු වරට අසන්නට ලැබුණු මේ සින්දුවේ / ගීතයේ "ලාක්ෂණය්" (ලක්ෂණයි) යන වචනය යොදා ඇත්තේ නෙත්කලු /දැකුම්කලු / දර්ශනීය යන තේරුම දීමටය. (ලක්ෂණ / ලකුණු යන්නේ තේරුම එය නොවේ.

"බලමින් ලකුණු ගත - දුදන ගුණ දැන ඔහු සිත" යන්නේ එය පැහැදිලි ව කියා ඇත. කෙසේ වෙතත් අද අපට " ලස්සන" යනුවෙන් ලස්සන වචනයක් ඇත. එය "ලක්ෂණ" වචනය දෙස බලා හදා ගත්තා විය හැකිය. "-ක්ෂ-" සඳහා "-ස්ස-" යෙදු කෙනා "ණ" සඳහා "න" නොගත්තේ ඇය් ? ලස්සන යන්න "ලස්සන්" යනුවෙන් හල් නොවන නිසා "ලස්සණ" කිරීම අනුමත කල හැකි ද ? ඇළ (කුඩා දිය පාර), ඇල (ඇද - කෙලින්නැති) දෙකම හල් නොවේ. දණ (දණ හිස), දන (ජනයා - වස්තුව) දෙකම හල් නොවේ. දානය යන තේරුමට දන් යෙදේ. මගේ අදහස නම් "ලස්සන" වචනය ගැමියාගේ වචනයකි. එය විසාරදයාගේ "වය්ශාරද්යය" අනුව "ලස්සණ" වී ඇත. අපට අක්ශර විනයාසය උගන්වන දහම්සිරියන් එය "ලස්සණ" බවත් සඳගෝමීන් "ලස්සන /ලස්සණ" බවත් කියා ඇත. ගඩොළු /ගඩොල්, ඇතුළු / ඇතුල්, ලිහිණි / ළිහිණි / සැලළිහිණි /සැළලිහිණි/සැළළිහිණි මේ දෙකම හෝ තුනම හරි නම් කල යුත්තේ කුමක්ද ?

න/ණ/ල/ළ/ශ/ෂ රැක ලියන ලද්දක් දන්තජ සහ තාලුජ යොදා ලියමු. ඒ ලියවිලි දෙක දෙවිදියකට කියවන /කියවිය හැකි ජගතා මොකාද?

"කලු වන් කලු රුවය් අපෙ ගම මදින්නා"
"රන්වන් එරන්වන් රන්වන් ලඳුනි"
"සුදුවන් දත් පෙන්නා සිනා සෙන" යන යෙදුම් අසා ඇති සඳගෝමීන් කියන්නේ "වණ:වර්ණය (පාට)" බවය්. සෝරත සාමීන්ගේ ලියවිලිවල ඇති අකුරු වෙනස අපට අදාල නැත. අපට එය අනුයෑම නොකල හැකිය.

සකු බස නොදන්නා කෙනකුට එක් ම ලියවිල්ලේ එක් ම වචනය දෙ-තුන් විදියට ලියවෙන්නේ ඒ නිසාය. ඉගැන්වීම "වහරනු සෙරෙන්" කල යුතු නම්, කෙලී - ගැන්නා, බැන්නා, පැරැන්නා (සඳගෝමීන් කියන්නේ " පැරැන්නා" නිවැරදි බවය්) නිවැරදි ලෙස පිලිගත යුතුය. අද මගේ අදහස නම් ඒවා නිවැරදි බවය්. වහරේ ඇති වචනයක කේන්ද්‍රය කුරුලු - කිරිලි - කිරිලිය (කිරිල්ල) කිරිලී, කොලු - කෙලි - කෙලිය (කෙල්ල) - කෙලී, බල් - බැලි - බැලිය - (බැල්ල) බැලී - බැල්ලී යන වචන සදොස් යැය් කිව නොහැක. " දියණිය - නැගණිය" යන වචන ඊයේ වන තෙක් මම බැහැර කෙලෙමි. අද මම ඒවා පිලිගනිමි. "නෛරුක්තික විදියට" එය සිදු වී ඇති සේ සිතා ගත් විට ඒවා



නිවැරදිය. ආණ, අණි, අණු ප්‍රත්‍ය එකතු වු පද නිත්‍ය බහුවචන බව වියරන පොතේ දැකවේ. අපි "අණි" ප්‍රත්‍යය වෙනස් කරමු. දියනි, දියනියක්, දියනියක, දියනියකට, දියනියකගෙන්, දියනියකගේ නිවැරදි සේ පිලිගනිමු.

එවිට මා + අණි = මෑණි - මෑණිය - මෑණියට, නැඳි + අණි = නැන්දණි - නැන්දණියට, මිති + අණි = මිත්තණි - මිත්තණියට යන වියහර ද නිදොස් විය හැකිය. "හත් මුතු පරම්ප-රාව" අනුව "මුතු" යන්නේ ඉතිරි ලිඟු පදය " මිති" වේ.

අපට නිවැරදි අක්ශර විනයාසය ඉගැන්වීම සඳහා ලියන ලද "සිංහල අක්ෂර විනයාස අකාරාදියේත් - නිවැරදි න,ණ, ල,ළ යෙදුමේත් (මට පේනෙන) අඩුපාඩුවක් සදොස් තැනුත් දැක්වීම මේ ලිපියෙන් අවසන් කරමි. "ළ : ළය (සිත), ළැගි : සිත් ගන්නා ලෙස" ලියන කෙනකුට ළ + ඇදි = ළැදි වේ. අරුණලු - අලුයම (අරුණාලෝකය - ආලෝක යාමය) ලියන කෙනකුට, හෙළි : එළි, එකෙළි: ඒකාලෝක, එළිය : ආලෝකය ලිවිය නොහැකිය. වන / වනු - වැනි - වෙනි, මහත - මැහැති - මෙහෙනි වන නියරට අනුව "ඔළුව : හිස" ලියන කෙනකුට " ඉඳලොලු" ලිවිය නොහැකිය. " ඔළු ඉන්දලා - ඔළුඉන්දල : - ඉන්දල:ඔළු ඉඳලොළු" වන බව ඔහු නොදනී.

ඉකිල්ල ලග, කිහිල්ලට යටින් වැනි කියමන් අසා ඇති කෙනකු ඒ වහර නොතකා ඉකිළිය, කිහිළිය ලිවීම පිලිගත නොහැකිය.

විළිය : ලැජ්ජාව, විළිබිය ලියන කෙනකුට " විලිරුදාව" ලිවිය නොහැකිය. බෙලෙක් විලි ඇරෙන්නට වෙන විලි ගැන අප අසා නැත. එක් පොතක වෙනු (විෂ්ණු), අනෙක් පොතේ වෙණු (විෂ්ණු) නිවැරදි යය් කීම අප මුලා කිරීමකි. කෘත : කළ බව දන්නා කෙනකුට විකෘත : විකල ලිවිය නොහැකිය. සිහිය විකල් වීම ගැන සිතා විකල ලියන ඇතැය් සිතේ, වලඳ, මැටි බඳුන බව කියා, වළඳ : භාජනය බව කීම "සිහි විකළ" වීමෙන් ලියන ලද්දක් ද? වක්කලම යන්නේ දෙමල මුනුහරක් පෙනෙතත්, මොවින් කියන්නේ, ගඟක වක් වු හෝ ගැඹුරු වු තැන යනුවෙනි. එහි වළ (ආවාටය) යන තේරුම ඇත්නම් (වක් + වළ + ම) වක්කලම හරි නැත. පැරණි / පරැණි නිවැරදි නම් පැරැන්නා හරි වන්නේ කෙසේද ? එක් පොතක එය මඟ හැර ඇත. අලස - ලස - ලැසි - ලහි - ලහිලහියේ යන පද වල ඇති සමාන කම විමසිය යුතුය. "යක්ෂණී" දෙස බලා යැකිණි ගැනීම වැරදිය. ඇත් + ඉනි - ඇතිනි - ඇතින්න, සප් + ඉනි - සැපිනි - සැපින්න, යක් + ඉනි - යැකිනි - යැකින්න නිවැරදිය. යැකිණි - ලස්සණ - ගැහැනු අති පන්ඩිත යෙදුම් ද? මෙනෙවි : මානවිකා, මාණවිකා:මෙණෙවි සිහිය විකල් වීමේ ප්‍රතිපලයක් ද?

මැළි : කසැමළි - ඇලි මැළි : කසැමලි. මැලි නිවැරදි නම් ඇළි මැළි දෙකම මූර්දජ විය යුතුය. බොහෝ යුගල පදවලින් එක් පදයක තේරුමක් නැත. එය අනෙක් පදය අනුව සකස් වී ඇත. අහල පහල, කුල, ඔළ මොළ මෙන්. පතළ : පැතිරුණු, පැතැලි : සමතලා ලියන්නේ පතළ ම අනම්‍යාදේශයෙන් පැතැළි වන බව නොදන්නා නිසාය. එක් පොතක සතළොස් නිවැරදිය. අනෙක් පොතේ සතලොස් /සතළොස් දෙකම හරිය. එක් පොතක පහනත්, අනෙක් පොතේ පහණත් හරිය. පස් දහස - පන්දහස, පන්සියය - පන්සියය, පස්සිල් - පන්සිල් වන විදියටම පස් දස - පන්දස - පනස හැදේ. එය පණස විය නොහැකිය.

නිවැරදි ව න /ණ - ල/ළ ලියන්නට ඉගැන්වීම තබා නිවැරදිව න /ණ - ල/ළ ලියන්නට දන්නා කෙනකු ගැන මම නොදනිමි.

නිවැරදි න /ණ - ල/ළ - ශ / ෂ උච්චාරනය කරමින් පොතක පිටුවක් කියැවිය හැකි කෙනකු ගැන මා අසා නැත.


## රන්තරු 2013

වික්ටෝරියානු භාෂා පාසලේ රොක්ස්බර්ග් පාක්
සහ එපින් මධ්‍යස්ථානයන්හි සිංහල භාෂා
පන්තිවල සිසු කැළ සහ ආචාර්ය මණ්ඩලය

**රන් තරු 2013 විවිධ ප්‍රසංගය**

නැරඹීමට පැමිණෙන මෙන්
ඔබ සැමට ආරාධනය කරති

ස්ථානය
**ප්ලෙන්ටි රේන්ජස් ආර්ට්ස් ඇන්ඩ් කන්වෙන්ෂන් සෙන්ටර්**
ෆෙරස් බුලවාඩ්
සවුත් මොරෑන්ග් වික්ටෝරියා 3752

**2013 සැප්තැම්බර් 8 දින පව 2 ට**

වැඩි විස්තර සඳහා දුරකතන අංක 0409 077 420


## 10 commandments for life.

Someone has written these beautiful words. Must read and try to understand the deep meaning of it. They are like the ten commandments to follow in life all the time.

1. Prayer is not a "spare wheel" that you pull out when in trouble, but it is a "steering wheel" that directs the right path throughout.

2. A Car's WINDSHIELD is so large & the Rear view Mirror is so small? Because our PAST is not as important as our FUTURE. So, Look Ahead and Move on.

3. Friendship is like a BOOK. It takes few seconds to burn, but it takes years to write.

4. All things in life are temporary. If going well, enjoy it, they will not last forever. If going wrong, don't worry, they can't last long either.

5. Old Friends are Gold! New Friends are Diamond! If you get a Diamond, don't forget the Gold! Because to hold a Diamond, you always need a Base of Gold!

6. Often when we lose hope and think this is the end, GOD smiles from above and says, "Relax, sweetheart, it's just a bend, not the end!

7. When GOD solves your problems, you have faith in HIS abilities; when GOD doesn't solve your problems HE has faith in your abilities.

8. A blind person asked: "Can there be anything worse than losing eye sight?" and the answer is: "Yes, losing your vision!"

9. When you pray for others, God listens to you and blesses them, and sometimes, when you are safe and happy, remember that someone has prayed for you.

10. WORRYING does not take away tomorrow's TROUBLES, it takes away today's PEACE.